# ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මූර්ති



**නිපුනතාවය** - දේශීය, විදේශීය චිත්‍ර මූර්ති කැටයම් ගෘහ නිර්මාණ කලාවන්හි අනන්‍යතා හදුනාගෙන ඒවායේ කලා ලක්ෂණ නිර්මාණ වලදී භාවිතයට ගනී.

**නිපුනතා මට්ටම** - ඉන්දීය ඓතිහාසක කලා නිර්මාණ අධ්‍යයනය

**ඉගෙනුම් ඵල** -

- ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් හමු වී ඇති සුවිශේෂී කලා කෘති සොයා බලයි.
- ඉන්දු නිම්න මූර්ති හා කැටයම් නම් කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම විස්තර කරයි.
- නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- ඉන්දු නිම්න කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

---

**සැකසුම - කේ. එම්. තිළිණි පියතිලක (කෑ/දෙහි/ දොඹේපොල කනිෂ්ඨ විද්‍යාලය.**

මෙම ශිෂ්ටාචාරය මොහෙන්දොජාරෝ හරප්පා ලෙසද හඳුන්වයි.

ශ්‍රීමත් ජෝන් මාෂල් මහතා පවසන පරිදි මෙම ශිෂ්ටාචාරයේ ස්වර්ණමය යුගය ක්‍රි.පූ. 2500 - 1500 අතර කාලයයි.

මොහෙන්දොජාරෝ හරප්පා ශිෂ්ටාචාරයට අයත් වැසියන් උසස් කලා කෞෂල්‍යයෙන් යුත්ක කොටසක් වූ බව කැනීම් වලදී හමුවූ මෙවලම් අනුව පැහැදිලිය.

**ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමුවන කලා නිර්මාණ**

**ශෛලමය හා ලෝහ ප්‍රතිමා**
**ආභරණ හා මෙවලම්**
**මුද්‍රා, සෙල්ලම් බඩු**
**වාස්තු විද්‍යා නිර්මාණ**

# ඉන්දුනිම්න ශිෂ්ටාචාරය



# 1

# පූජක රුව



# පූජක රුව සොයාගෙන ඇත්තේ **මොහෙන්ජොදාරෝ** නගරයෙනි.

# මෙයින් පුරුෂයකුගේ උඩුකය දැක්වේ.

# ජීවමාන කෙනෙකු නිරූපණය කිරීමට ගත් උත්සාහයක් ලෙස පෙනේ.

# සෙ.මී. 19 ක් උස ය. **සුදු හුණු** ගලින් නිමවා ඇත.

# මෙයින් **පූජකවරයකු** නිරූපණය වන බව සාමාන්‍ය පිළිගැනීමයි.
(ඒකාංශ කරන ලද සළුව, අඩවන් දෙනෙත් හා හිස අඩක් මුඩු කොට තිබීම මෙම රූපය භාවනානුයෝගී පූජක රුවක් ලෙස හැඳින්වීමට හේතු වී ඇත.)

# ඒකාංශ කරන ලද සළුවෙහි පෙති තුනක මලක හෝ කොළයක හැඩය ගත් රටාවකින් සරසා ඇත.

# නළල මත ගාංචුව සහිත නලල් පටියකි.

# තත්ත්වාකාර නිරූපණ ස්වරූපයට වෙසසින් වෙනස් වූ ශෛලීගත සම්ප්‍රදායක් අනුව නිරූපණය කරන හැඩතල මෙහි දක්නට ඇත.

## 2

# නළඟන



# **හරප්පා**වෙන් හමු වූ ලෝකඩ නළඟනගේ රුව.

# ඉන්දු නිම්න වැසියෝ ලෝහ වාත්තු කිරීමේ තාක්ෂණයෙන් පරිණතව සිටි බවට මෙම ලෝහයෙන් කරන ලද නළඟන රුව හොඳ ම සාධකයකි.

# **ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමයෙන් පූර්ණ උන්නතව** නිමවා ඇති මෙහි උස අඟල් 4 1/2 කි. කාන්තා නාරි දේහයේ ලාලිත්‍ය මනාව මතු කොට දක්වා ඇත.

# ඇස් අඩවන් ය. **ප්‍රකෝපකාර ඉරියව්වකින්** සිට ගෙන එක් අතක් ඉනෙහි තබාගෙන එක් කකුලක් අඩක් නැමී සිටින ආකාරයෙන් නිමවා ඇත.

# කෙසඟ නග්න රුවක් වූ මෙම කාන්තා රුව කලාත්මක ය.

# ගෙල බැඳි මාලයත්, දෙඅත්හි ඇති වළලුත් මෙහි දැකිය හැකි ආභරණයන් ය. එය එකල ඉන්දු නිම්න වැසියන් ආභරණ පැළඳීම පිළිබඳ ප්‍රබල සාක්ෂියකි.

# මෙයින් දෙවොලක රඟන ස්ත්‍රියක් නිරූපණය වේ යැයි මතයකි. දැනට **නවදිල්ලි ජාතික කෞතුකාගාරයේ** තැන්පත් කොට ඇත.

# 3

# රතු වැලි ගලින් කළ කවන්ධ මිනිස් රුව



\# මානව දේහයේ සුන්දරත්වය ඉතා සියුම් ලෙස හා මට සිලිටු ලෙස දක්වා ඇති කවන්ධ මිනිස් රුව ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ උසස් කලා කෘතියකි.

\# **ග්‍රීක සම්භාව්‍ය කෘතිවල මූර්තිමය ලක්ෂණ** දක්නට ඇත. මූර්තිය මනාව ඔපමට්ටම් කිරීමෙන් මස් පිඬුවල ස්වභාවිකත්වය පෙන්නුම් කර ඇත.

\# අඟල් 4 (සෙ.මී.10) පමණ උස ය. රතු පැහැති හුණු ගලින් නිමවා ඇති මෙය **පූර්ණ උන්නත මූර්තියකි.** මෙය සොයා ගෙන ඇත්තේ **හරප්පාවෙනි.**

\# මෙම මූර්තියෙන් අරෝහ පරිනාහ පුරුෂයකුගේ ලක්ෂණ නිරූපණය කරයි. නග්න රුවක් වන මෙය **ශිවගේ මූලාදර්ශ නිර්මාණයක්** වශයෙන් හඳුන්වයි. ඊට හේතු වශයෙන් මූර්තියේ අත් හතරක සාධක දක්වයි.

\# හිස අත් පා නොමැත. හිස සහ අත් පා වෙන ම කොටස් වශයෙන් තනා තිබෙන්නට ඇති බව පෙනේ. මෙම කොටස් සවිකිරීම සඳහා සිදුරු භාවිත කොට ඇති බව දැකිය හැකි ය.

# 4

# අළු වැලි ගලින් කළ කවන්ධ මිනිස් රුව



\# **හරප්පාවෙන්** හමුවන මෙම කවන්ධ මිනිස් රුව පූර්ණ උන්නත ශිල්ප ක්‍රමයට අළු වැලි ගලින් නිර්මාණය කර ඇත.

\# උස සෙ.මී. 10 කි. වම් කකුල ඉහළට ඔසවාගෙන සිටින නර්තන විලාශයක් පෙන්නුම් කෙරේ.

\# මෙයින් ශිව දෙවියන්ගේ එක් වේෂයක් වන **නටරාජ නර්තන ස්වරූපය** පෙන්නුම් කරන බව විචාරක අදහසයි.

\# ග්‍රීක, රෝම, සම්භවය මූර්ති නිර්මාණවල දක්නට ලැබෙන ස්වභාවික තාත්වික ලක්ෂණ මෙම කවන්ධ රූපයෙන් ප්‍රකට කෙරේ.

## වැඩිදුර තොරතුරු පහත සඳහන් වෙබ් අඩවි හරහා ලබා ගත හැක.

https://www.youtube.com/watch?v=LNgRfumBjPI

https://www.e-thaksalawa.moe.gov.lk/web/si/library-section/e-library-content/item/456-indunimna.html?catid=0

https://si.wikipedia.org/wiki/%E0%B6%89%E0%B6%B1%E0%B7%8A%E0%B6%AF%E0%B7%94_%E0%B6%B1%E0%B7%92%E0%B6%B8%E0%B7%8A%E0%B6%B1_%E0%B7%81%E0%B7%92%E0%B7%82%E0%B7%8A%E0%B6%A7%E0%B7%8F%E0%B6%A0%E0%B7%8F%E0%B6%BB%E0%B6%BA

https://divaina.com/daily/index.php/visheshanga3/48367-2020-09-29-11-38-59

## මෙම පාඩම ඇසුරින් සකසන ලද "World wall" ක්‍රියාකාරකමට යොමුවීම සඳහා පහත සඳහන් ලින්ක් එක භාවිත කරන්න.

https://wordwall.net/resource/19136050